# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1606/10 - 2009 ජුනි 16 වැනි අඟහරුවාදා - 2009.06.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 21/78.

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

27 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන අමාත්‍ය මහාචාර්ය වටරක ආරච්චිලාගේ විශ්වා වර්ණපාල වන මම, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත මේ නියමය මගින්, (2007 ඔක්තෝබර් මස 09 වැනි දින අංක 1518/15 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය මගින් අවසන් වරට සංශෝධිත) එකී පනතේ 139 වැනි වගන්තියේ විධිවිධාන ප්‍රකාරව, ඉහත කී පනතේ 21 වැනි වගන්තිය යටතේ සාදන ලද නියමයක් ලෙස සළකනු ලැබිය යුතු සහ යාපනය විශ්වවිද්‍යාලය පිහිටුවනු ලැබූ නියමයේ උපලේඛනයේ, I වැනි තීරයේ දැක්වෙන "විද්‍යා පීඨය" යන අයිතමයට අනුරූපව එම උපලේඛනයේ II වැනි තීරයේ දැක්වෙන අයිතමවලට ඉක්බිතිවම පහත දැක්වන අයිතමය ආදේශ කිරීමෙන් එම නියමයේ උපලේඛනය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :—

" 7. ධීවර අධ්‍යයන අංශය " .

මහාචාර්ය වටරක ආරච්චිලාගේ විශ්වා වර්ණපාල,
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2009 ජුනි මස 05 වැනි දින,
කොළඹ දී ය.

 ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.